
# ලන්ඩන් කවි
# LONDON KAVI

2 Queens Parade, Green Lanes, London, N8 0RD
Tel: 020 83476211, Fax: 020 83415905, Email: kavi@londonkavi.com
Free Circulation - Vol 1 Issue 5 May - June 2004


## එතෙර ගිය පොඩි දුවට



අපේ රටේ දරුවන් සිව් දෙනෙකුට ස්වීඩනයේ මව්පිය ස්නේහය ලැබීමේ වාසනාව උදාවී තිබේ.

- පුවත්පත් වාර්තාවක් -

වැහැරී ගිය උකුලේ නැත
සුව යහනක් සැදුණේ
වියළී ගිය දෙතනේ නැත
කිරි බිඳුවක් එරුණේ
කප පවතින තුරු නොනිමෙන
සුසුමෙන් සමු ගැනුණේ
හිරු ගිලිහෙන මොහොතක නුඹ
මඟ අයිනක රැඳුණේ

උපන් බිමට නුඹ වැඩිවා මිසක දුවේ
වැදූ මවට නුඹ වැඩියක් වී ද දුවේ
දුක උහුලා ඉන්නට මට හැකි ය දුවේ
නැව් නැඟිලා දුරු රටකට යන්න දුවේ

පෙර කළ මහ පින් මහිමෙනි
මේ දෙස උපදින්නේ
ඉපදෙනු මිස රැඳෙනා පින
ඇයි නුඹ සතු නොවුණේ
දරුවන් ඇස කඳුළින් ළය
උණුවන මිනිසුන්නේ
සරණින් ලොව කොතැනක වුව
සැනහෙන් දියණියනේ

මතුයම් දිනෙක සිතිවිල්ලෙන් සිටින සඳ
දැතක පහස සිහිනෙන් මෙන් දැනේ විද
සිතියම් පොතින් ලොව විමසා බලන සඳ
කඳුලක හැඩය මහ සයුරේ දකී විද

- දයාසේන ගුණසිංහ.



**වෙසක් දවසෙ සිල් අරගෙන තුන්සිත සන්සුන් වුණා ද**
**දම්ම පදය සිතට දැනෙන ලෙසින් යසට කියවුණා ද**
**පැනලා ගිය මැගීගෙ කෙලි නිති සිහියට එළඹුණා ද**
**නිවන් පුරේ දොරටුව ළඟ පය පොඩ්ඩක් පැටලුණා ද**

(ඡායාරූපය - ආරියබණ්ඩාර සමරකෝන්)

## සඳ දැකුම

පීඩා සිත නිවාලන්නට
සඳක් පායා ඒ මැදියම් රැය ලෙස
සඳ පායාවිත් අඳුර ඉරාගෙන
පහන් කරවයි සිත සුවය දෙන සදාතන

කළුවර අහසක් යට සැකයෙන්
අතපත ගා පිය මනින විට
සඳේ ඔබ නිහඬාලෝකය
ගලා හිත තුළ අදිටන් මල් පුබුදයි

දුක දරා ගනු බැරි ව සිත
හඬා ගඟ දිය ඉතිර යන්නේ
පිපාසය නොනිවාලන සයුරටයි.
සඳේ කරුණා රැස් ගලා වඩදිය බාදිය වී
දිය බඳ සිඟිති මාළු නටයි.

□ සපුමල් බණ්ඩාර - ලන්ඩනය.

## දූරංගමං ඒකචරං

සැණෙකින්ය දුරගමන් යන්නේ
ගුහාවක් තුළ කල් ගෙවන්නේ
සිරුරකුත් නැති ලෙස පෙනෙන්නේ
ඔබ මගේ ලෙය තුළ ද ඉන්නේ

වසාගත් විට දොර කවුළු සැම
පියාපත් ලැබ පලා යන්නේ
ගෙවා දුරකතරක හඹා ගොස්
හතිවැටීදෝ නැවත එන්නේ

සරා හිස් කුස් සුළං දහරේ
පාවෙමින් කල් ගෙවා ලන්නේ
අනන්තය තෙක් පියා සලමින්
නැවත විත් යළි ලැගුම් ගන්නේ

සහස් මුරකාවල් යොදා නිති
තබා සිරකර ඈ සිටින්නේ
නෙතින් දැකුමට නැතත් ඔබ මට
සිතින් නිති තුරුලු ව සිටින්නේ

සරා සක්වල එතර මුහුදත්
පුරා සෙනෙහස් දිය ගලන්නේ
සරා සඳවන් ඇගෙ මුහුණ සිප
යළිත් මා තුරුලට වරෙන්නේ

පාවෙමින් පාවෙමින් දිය තුළ
ජීවිතේ අනියත දකින්නේ
නිවී යෑමට පෙර පහන්සිල
කිමද ඔබ එක් තැන් නොවන්නේ

වෙනස්වන හුදු ලෝකයේ සැප
නීරසයි යනුවෙන් කියන්නේ
මගේ සිත ඔබ මා තුළ ම මිස
නැත අනෙක් හද තුළ රඳන්නේ

□ නීතිඥ සුනේත්‍රා යූ. ආර්. වනිගසේකර
ලන්ඩනයේ දී.

## සුභාෂිතයෙන්...

බුදිත් මිහිරි මී අඹ රසය සතොසින
ඉදිත් සොඳුරු ගෙවුයන්වල තුරු මුදුන
සිරිත් මෙ ඈ කරතත් කොවුලන් ලෙසින
වසත් කළ ඇනෙයි රිටු පරපුටු නදින

මිහිරි මී අඹ රසය විඳිමින්, අලංකාරයෙන් යුත් ගෙඋයන්හි ගස් මනසට මේ සියලු දේ කෝකිලයන් මෙන් කරමින් සිටිතත් වසන්ත සමය ළඟා වූ විට කපුටා ගේ හඬ උෟ පවා දෙයි.



## සත්පුරුෂයාණෝ

සත්පුරුෂයාණෝ
සෙමෙන් කුටියට ඇතුළු
වන්නෝ
සැඟව සිටි
තියුණු අවි දැරූ සොරු
ඉල්ලීය වස්තුව උහුගෙන්
රතැසින්

හදක් මෙන් නික්ලේශ වූ
නොවූයෙන් වස්තුවක් කුටියෙහි
ඉල්ලීම සපුරනු සොරුගේ
පුද කළහ හැඳිවත ගලවා

'තබාගෙන මේ ගොමස්කඩ
දෙව හස්තසාර වස්තුව'යි
කීය නොතිත් සොරු නැවතත්

සත්පුරුෂයාණෝ නිරුවතින්
නඟිත් නිහඬ ව
අසබඩ ගල් තලාවට
දිය හැකි නම් මේ සඳ
සොරුන් තුටුවනු ඇතැයි සිතුවෝ
සඳ රැසින් නැහැවී

ගෙනෙනු ව සඳ පහළට
මහා සිත් බලයක් මවා
දෑත දිගු කොට තැත් දැරූ විට
දිටී

කැටපතක් තබා එහි
කවුද සඳ සොරකම් කරන්

□ ලාල් හැගොඩ



# අම්මේ!

දුක සංවේග තිබුණද හද දෙකට කපා
'ඔබ ඇයි මපුත ගියෙ මට පෙර සිනහ පපා
දොඩමින් වැලපෙමින් හැම විට දෙතොල හපා
අම්මේ තවතවත් ඔබ නම් හඬනු එපා

ඉසිමන් ක්‍රෝධ තන්හා ආශා පල වා
හැර දිවි ගෙවන්නට අම්මේ මා සිතූ වා
දුටුවේ අයුක්තිය පමණයි හද රිද වා
දුක සංවේග මැද කඳුළැලි මම හෙළු වා

කිසිවකු අම්මෙ නැහැ දුටුවේ මගේ අගේ
මොනවා කරන්න ද ගෙන ආ පවයි මගේ
ලෝකයා සැලකුවේ මට තිරිසනකු වගේ
මට නැහැ අම්මෙ මනු ලොව නම් තවම අගේ

දවසට දෙතුන් වර මා නොමැරී මැරු ණා
දෑසට කඳුළු කැට මතුවී දුක දැනු ණා
අහිංසක ව මගෙ හදවත දෙපලු වු ණා
මරුවා වෙතට ළං වන්නට එකඟ වු ණා

කුමටද මල් වඩම් අම්මේ නැති කල ට
මා දැන් දෙව් ලොවක ගත නම් පොළොව ය ට
බුදු දහමේ අගය දිස් වෙයි දැන් මෙම ට
අම්මත් නිවන් දැක එන දින සතුට ම ට

□ තිලක් ප්‍රනාන්දු
ලන්ඩනය.



## An Upturned Shell
(A Beggar's Retribution)

"Get out of my boutique
No shelter here for you. You stink!"
Carrying a coconut-shell to collect alms,
Stumbling, shuffling with the aid of a stick,
The scarecrow figure of a ragged old beggar,
Blind in both glazed, vacant eyes,
Sought shelter from a monsoon downpour.
"Out, out! You'd drive customers away!"
Furious, the fat merchant pushed the old man,
Who reeled over, collapsed, and soon died.

Weeks passed.....
But in the pleading symbol of the upturned shell,
Now full of rain-water,
A mosquito had laid her deadly eggs.....
Malarial-fever killed the merchant.

□ **Denis Jansz** - London.

# වසවත් මරු
# බුදුරදුන්ට පිරිනිවන් පෑමට
# අයැදුම් කරයි.

වියපත් ඔබ තුමට බැහැ දැන් දම් දෙසුම
සාවක පිරිස ඇත ඒ ගැන ඇති දැනුම
එනිසා ඔබ තුමන් කළ යුතු දෙය සැවොම
නොඅඩුව ඉටුවේවි සුදුසු ය පිරි නිවුම

බුදුරදු හමුවෙ වසවත් පැමිණී දිනෙක
පැවසිය මෙලෙස කරුණා ගුණවත් ලෙසක
නුඹෙ අයැදුම නැතත් වැඩහිඳ තුන් මසෙක
පානෙමි නිවන් ඒ මගෙ අදිටනක

මෙසේ මරුට පිළිතුරු දීමෙන් පස්සේ
විඳගත නොහැකි දුකවැද මුළු රෑ තිස්සේ
සම්බුදු තුමගෙ ගුණ කිය-කිය ඒ ඔස්සේ
හඬනා අනද දුටු එල්ලී උළුවස්සේ

ඇයි ආනන්දයෙනි ඔබ මේ හඬන්නේ
ඇඬුවට කෙලෙසක ද නොමැරී සිටින්නේ
උපතත් සමගම ය මරණය ගෙනෙන්නේ
ලොව්තුරු බුදු නැණෙනි මේ තතු දකින්නේ

කීවත් නොකීවත් මට වසවත් මාර
පිරිනිවනෙහි වග සිහිවුණු දින නෑර
මරණෙත් අපගෙ දැකුමෙක් අන්තිම වාර
මේ යයි අනඳ සිහියෙන් ගනු මැන බාර

ඇඬුමෙන් පලක් නැති බව දැන් සලකන්න
බුදු බව ලදත් මරණය බැහැ වලකන්න
සියලු සතාට ම වේ මෙය පිළිගන්න
සොබාදහම ගැන සිහිකර සැනසෙන්න

ලක්‍ෂ කෝටි ගණනින් දැහැනයෙහි යෙදී
සුබද තෙරනුහට අන්තිම ඔවදන දී
දෙව්බඹ මිනිස්හට අමදම් නිතින් බෙදී
තිලොවග පියා තිලොවෙන්නෙත් වසන ලදී

පෙන්නා අසිරිමත් වූ පෙර හරනයක
පමා නොවන ලෙස දෙසූ දම් අතිරේක
පුහුදුන් දනන් ගිල්වා සයුරෙහි සෝක
පළ කොට අනිත බුදු හිමි පිරිනිවි සේක

□ ඩී.ජේ. ලියනපටබැඳි
බොරලැස්ගමුව.

මීළඟ කලාපය සඳහා
ඔබගේ නිර්මාණ
**ලන්ඩන් කවි**
**2 Queens Parade**
**London N8 ORD**
වෙත යොමු කරන්න.

# වෙසක් ආසිරි!

පිඹ පිඹ පෙරට ආ නාලාගිරි ඇතු ට
තම නම ඇසූ පමණින් ගැරහු සත ට
සම මුදු සිතත් මෙත් කරුණා පෑ යස ට
බුදු හිමි සිහි කරන දෑ ආසිරි ඔබට

දිනක් එළඹ ඇත අමුතුම සෙතක් දැනේ
ගසක් වැලක් නෑරම මල් පොකුරු තැනේ
රැයක් විහිදුවයි සඳ රැස් මහිමි ගුණේ
වෙසක් සඳ මැදින් ඔබගේ මුහුණ පෙනේ

□ දොස්තර බුද්ධදාස බෝධිනායක

## With Whom Should One Associate?

Associate with the wise
WHO
Show the dangers
in life.
Look upon one
WHO
Points out one's faults
As though giving hidden treasure.
Following thus one follows good
And
does not follows evil.

**(Dhammapada)**

**Ven. Boralesgamuwe Pemaratana**
**London Buddhist Vihara.**

# සෝම හිමියෙනි....

ගර්මයෙන් පීඩිත වාලුකා තලයේ
පවසින් පෙලෙන සිසිල් පැන් පොදක් සොයා
අපි ඔබ වෙත ආවෙමු.....

පිපෙන්නට පෙර දහස් ගණනින්
වනේ වල මල් බිමට සැලුණා
ඇසේ කඳුළැලි ගලාගෙන විත්
දුකට මිහිමත හඬා වැටුණා
අහස් තලයේ කළු වළාකුළු
ගිගුම් දීගෙන එකට ගැටුණා
සසුන් අඹරේ උදා වූ සඳ
සදහට ම ගණ පටෙන් වැසුණා

සිහළ දැය තුළ අඳුර දුරුකළ
අඳුරු පහනකි නිවී යන්නේ
විදෑ උවදුරු බමුණු ඇදහිලි
ගැඹුරු දහමින් බිඳ දමන්නේ
අපේ ලක්මව දරාගන්නට
බැරි ව සෝකෙන් බිම හැපෙන්නේ
යළිත් කවද ද උගත් රුවණක්
සිහළ දෙරණට පහළ වෙන්නේ

සෝම හිමි සඳ මිය ගියේ නැත
දැයේ කොන්දයි කඩා වැටුණේ
අපේ පිනටයි සුවඳ කුසුමක්
සිසිල් ගංගොඩවිලක පිපුණේ
එපා හිමියෙනි දැන්ම නිවනක්
දැනුයි සටනක් පටන් ගැනුණේ
දරාගන්නට බැහැ වියෝ දුක
ඒ නිසායි මේ කඳුළු සැලුණේ

□ ප්‍රසාද් හේමන්ත
මහ කොමසාරිස් කාර්යාලය, ලන්ඩනය.

# එළිසමය



කවි මඩුවක දී අනාරාධිත ව වේදිකාවට ගොඩ වූ අයකු හිටිවන ම කවියක් ඉදිරිපත් කිරීමට උත්සාහ කළේ ය. ඔහු එළිවැට තියාගත්තේ තරමක් අමාරුවෙනි. තුන්වන පදයෙන් එහාට යාමට නොහැකි වූ ඔහු කීප වතාවක් ම තුන්වන පදය ගායනා කළේ ය. එවිට වහා ම නැඟී සිටි මුලසුනේ කවියා හතරවැනි පදය සම්පූර්ණ කළේ මෙසේ ය.

කවියා

කවියන් කුකවියෙන් කළ හින්දා දෂ්ඨ
සරසවි දැන් පෙළෙයි රෝගයකින් කුෂ්ඨ
එනිසා රසවතුනි මේ සබයෙහි ශිෂ්ට

මුලසුන

බැරි එළිසම නොගෙන ඉඳගන්නව මිස්ට!


## ලන්ඩන් කවි

සංස්කාරක - අනුර හැගොඩ
**Editor -** Anura Hegoda
සංස්කරණ සහය - යසිරු සමරකෝන්
මලිත් හැගොඩ
අනෝමලී - අනුත්තරා
**Editorial - Assistance** Yasiru Samarakoon
Malith Hegoda
Anomali - Anuthara
වෙබ් අඩවි නිපැයුම - කසුන් පලන්සූරිය
**Web Design** - Kasun Palansuriya



# දුටුගැමුණු රජ සහ ස්වර්ණමාලි දෙව්දුව

- රචනය රඹුක්කන ජී.ඇම්. සලා

(උපුටාගැනීම - සිංහල සැහැලි - 1957)

රුවන්වැලි වෙහෙර පිහිටා තිබෙන තැන විමාන දේවතාවියක් අරක්ගත් රන් තෙළඹුවක් තිබුණේ ල - ඇගේ නම ස්වර්ණමාලී ය. වෙහෙරට බිම සකස් කිරීම සඳහා තෙළඹුව ඉවත් කිරීමට අවශ්‍ය විය. එහෙත් දේවතාවිය ඉන් ඈත්වීමට නොකැමැති වූවා ය. දුටුගැමුණු රජ නොයෙක් ලෙසින් ඇවිටිලි කොට ඇය ගේ නමින් චෛත්‍යයට නම් තබන බවට පොරොන්දු වී ගසෙන් ඉවත් වීමට ස්වර්ණමාලිය කැමති කරවාගත්තේ ය. චෛත්‍යය ස්වර්ණමාලී නම් වූයේ ඒ පොරොන්දුවේ ප්‍රතිඵලය වශයෙනි. රජ දේවතාවියට කළ ඇවටිල්ල ජනකවියා ලගන්නා බසින් පවසන්නේ මෙසේ ය.

"උගත් රජුනි ඇයි ඔබ කරුණා නොකරන්  නේ
මෙරන් තෙළඹු රුක හැර මම කෙලෙස ද යන්නේ
සොවින් මෙමගෙ හදවත ගිනි වැද  කකියන්නේ
බැවින් තෙළඹු ගස කැපීමට නැත ඉඩ  දෙන්නේ

එතුන් මුනිඳු සමයෙහි රන් මැළි මහ සෑ  යේ
නමින් චේති පිහිටා ඇත මෙගරු බූමි  යේ
අලංකාර ලෙස රුසිරෙන් දිලෙන දෙව්ලි  යේ
ගසෙන් බිමට බැසපන් අද ස්වර්ණමාලි  යේ

උනා වරල රන් සිකිපිල සේ ම බැබලි  යේ
වනා දෙතොල මිහිරි තෙපුල් කියන දෙව්  ලියේ
සිනා සිසිලි බස් නොකියන් මෙඅද සුරලි  යේ
වහා තෙළඹුවෙන් බැස පල ස්වර්ණමාලි  යේ

නුවන් සපිරි ඉඳුනිල් මින සේම සුදිලි  යේ
අලන් කාර ගෙලවට රන්මාල බැබලි  යේ
උතුන් තිසරණේ අනුහස් හැඳින දෙව්ලි  යේ
මෙරන් තෙළඹුවෙන් බැසපල ස්වර්ණමාලි  යේ

මනා රුවින් තෙළඹුව උඩ සිටින ලි  යේ
සිනා බසින් දන මන තුටු කරන ලි  යේ
දිලේ නුවන් නිල් මිනි පරදනසෙ ලි  යේ
ඉතා සැණින් බැස පල ස්වර්ණමාලි  යේ

උවනය දිලෙයි පායන පුර සඳසෙ ලි  යේ
හුනුවිය මහද නුඹ කියනා බසට ලි  යේ
අලලිය මල් කැකුල සෙ රුව දිලෙන ලි  යේ
බැසපිය තෙළඹුවෙන් අද ස්වර්ණමාලි  යේ

රන්වන් එරන්වන් රන්වන් කොමළ ලි  යේ
රන්වන් එරන්වන් ගෝමර බඳ දිලි  යේ
රන්වන් එරන්වන් නුඹෙ රුව කළ එළි  යේ
රන්වන් තෙළඹුවෙන් බසු ස්වර්ණමාලි  යේ

මසිතට දුකයි ඉකිබිඳ නොහඬන්න ලි  යේ
සසුනට ලොබින් මම විත් පවසන්නේ ලි  යේ
මතුවට පවතින්ඩ දා ගැබ බඳිමි ලි  යේ
නොමසිට ගසෙන් බැස පල ස්වර්ණමාලි  යේ

"මගේ විමන හැර යන්නට දුකයි අ  නේ
ගඟේ වතුර මෙන් කඳුළැලි ගලයි සෙ  නේ
මගේ නමත් මතු පවතින ලෙසට අ  නේ
මගේ නමින් බඳවනු දා ගැබ මෙත  නේ"



# පූජේමි බුද්ධං කුසුමේන නේන....

(සත්‍ය සිද්ධියක් අළලා ලියූවකි.)

මලින් පිරුණ වසන්තයක
කෝකිලාවන් නදින්
බමර ගී රාවයෙන්

නැවුම් රසක් ගෙනේ
රසික සිතුවිලි මැවී
මා හදද පිබිදිනී.

පොපියන්නට තතනන
කුසුමකට සමවන
සඳකැලුම් පරයන
මිහිරාවියක අතගෙන

මා තනිවූ කුටියේ
පාළු බව බිඳ හැර
ලව්කික මිහිර-
-පෙරළා මදුවිතකට
ගෙවන සඳෙහි දින සකි
යසස අයස
සතුට අසතුට
අපට ද එය ම එලෙසට

සොඳුරු ආදර මගේ,
වේදනා දැනෙනවා
උදරයේ යට කොනක.
ඇත්ද පිළිතුරක්
වෙදැදුරෙක් හමුවුණා
මහම මහ රෝහලක

පිරික්සමින් හොඳට
ඇපැන්ඩියේ නිසැක කොට
කළ යුත්ත නිසැක කොට
උපදෙසකිය කපා දැමුමට

මේ විද්දියා යුගේ
සැත්කමකි මෙය සුළු

විවර කොට තැනකින්
කපා එය නිමකළා

රෝහල වෙත ගෙනා
ලෙඩ සැවොම සුව වුණා
සුරතල් පොඩි හිනා
දෙතොල් මත රැඳවුණා

වැටුණමෙන් ගෙඩියක් ගහෙන්
නොසිතූ ලෙසකින් සැණෙන්
වේදනා ගලාවිත්
ඇඟමතෙහි වැතුරුණා
හුස්මටික සැඟවුණා!

රිදෙන කකියන හඬෙන්
වෙදැදුරුට සැලකළා
ඇයිද මේ අසහනේ
මොකද මේ වූ විපත්.

චේතනාවකින් හොඳ
කෙළෝ එය සුවපතා-
කනගාටු ය මටත්.

සුවඳයි සුන්දරයි පුබුදින විට
දුගඳයි සිරිකිතයි - පරවෙනකොට
ජීවිතේ මහ දුකක්,
තව විටෙක කුණුගොඩක්
තණ අගෙහි පිනි බිඳකි,
බුදුන් වදාළ බවෙකි.

පෙත්තැකි ලී මල වියැළී
අඳුරු අගාධයක පතිත වී

□ කරුණා බස්නායක
ලන්ඩනය.

# The Carnival of Youth

There was a carnival
Where we all enjoyed
We were the fun makers
We were the fun takers

Colourful flashes
Music and the dancing floors
And merry - go - rounds

Nobody noticed
The clock of reality
Kept on passing.......
Then it was time
For us to leave the carnival

We kissed each other
And whished each other
Got their bags
along their own paths

Somebody must be there
To clean the place
Where the carnival was

Everybody left
With out stopping even a second
To see the empty ground of the carnival

I was left to clean it all
What a joyfull carnival
What a fate...... oh......
What a fate?

**Swarna Herath**
**Enfield**

## Spring Poems

Spring is on its way,
The air is Fresh.
Spring makes me happy
New lambs are growing in a beautiful meadow.
The flowers on the sweet grass green growing too.
I am as free as a butterfly
Te new baby birds are singing in the Tree.
Blossoms are ringing all around filled with lovely colours and covering the Grass.

**By Navin Perera.**
Year 4P, Stag Lane Middle School, Edgware.

# මෙන්න ගෑනු!

ආදරය කළ තැනැත්තා නොලැබී, විවාහය ප්‍රමාද වී, දුක්වෙවී සිටි සිටි ගැමි කතක් තමාට වඩා වයසින් වැඩි ආබාධ කීපයකින් යුතු සැමියෙකු සරණ පාවාගත්තී ය. ඇය දිය ගෙන ඒමට ගඟට යන විට එහි සිටි ගමේ ගැහැනුන් ඇගේ සැමියා ගේ ඇදකුද පවසා සිනාසුණෝ ය. එයින් කේන්තියට පත් ඇය සැමියා ගේ හැඩය පෙනෙන්නේ තමාට පමණ මැයි කියා මේ කවිය කීවේලු.

බකල ගැහුණන් කොරල පිපුණත් ගමන් යනකොට හරි හැඩයි
ඇට ද පෑහී නහර මතුවී ගියත් සව්බල ඇති හැඩයි
වකුටු කොන්දට කොට්ටෙ තියලා නිදාගත්ත ම හරි හැඩයි
කවුරු මොනවා කියා පෑවත් මගේ මිනිහා මට හැඩයි

# බොරලැස්ගමුවේ ජී.එච් පෙරේරා (1896-1948)



1896 ජූලි 14 වැනි දා බස්නාහිර පළාතේ, බොරලැස්ගමුවේ, රත්තනපිටියේ දී උපත ලැබ 1948 සැප්තැම්බර් 18 වැනි ද කලුරිය කළේ ය. උප්පැන්න සහතිකයේ සඳහන් සම්පූර්ණ නාමය ගල්හේනේ හෙන්ද්‍රික් පෙරේරා යනුයි. වෘත්තියෙන් ගුරුවරයෙකි. ඌරුගල, උඩහමුල්ල, කිරුළපන, මාගල්කන්ද, තලංගම, මඩකුඹුර, බොලොස්ගම, කොල්ලුපිටිය, මුල්ලේගම, කෝට්ටේ, කළුබෝවිල යන පළාත්වල ගුරුවරයෙකු සහ ප්‍රධානාචාර්යවරයෙකු ලෙස පුරා දෙතිස් වසරක් සේවය කළේ ය. පුවත්පත්වලට ඇතැම් ලිපි සම්පාදනය කරන ලද්දේ 'පිංගලපුත්‍ර', 'රාජමුරාජී' යන ආරූඪ නම්වලිනි. ලියා පළ කළ ගද්‍ය-පද්‍ය කෘති අතර බුද්ධස්තෝත්‍ර, කයිකතන්දර, බොරලැස්ගමු රචනා, සුදු අන්තුවා, සිංහල මංගල සූත්තර, එළිදරව්ව, වරකා මඳුළු ආදිය වෙයි.

කොළඹ පළමු යුගයේ කාව්‍ය පරපුර නියෝජනය කළ පුරෝගාමී කවියෙකු වූ ජී.එච්. පෙරේරා කාව්‍යකරණයට එළඹියේ සොළොස් වන වියේ දී බව කියැවේ. ඔහු ගේ සමකාලීන කවීන් මෙන් ම චිරන්තන කාව්‍ය සම්ප්‍රදාය සහ ජන කාව්‍යයෙන් ද ආභාසය ලබමින් කාව්‍යකරණයේ යෙදුණු අතර එකල උග්‍ර ලෙස පණගැන්වී තිබූ අධිරාජ්‍ය විරෝධී අරගලය කුළුගැන්වෙන අයුරින් ද බොහෝ කාව්‍ය නිර්මාණ ඔහු අතින් බිහි විය.

බටහිර ගැති සිංහලයන් ඉංග්‍රීසි බස අවිචාරවත් ලෙස යොදාගන්නා අයුරු ඔහු ගේ උපහාසයට ලක්වූයේ මේ අයුරිනි.

ආදර බර පියා 'පාදර්' වෙලා මව් 'මදර්' වී
සොඳුරට 'මයි ඩාලින්' 'කම් හියර්' දෙඩේවී
ගෙදර හිරමනේ පොල් ගෑම ඉංග්‍රිසි තාලෙන්
මජරකම නොවේ නම් මේ මොකක් දැයි ඉලව්වේ

*(සියබස පද්‍ය රචනාව)*

උගත යුතු ය ඉංග්‍රිස් ඒ නමුත් පොඩ්ඩකින් බෑ
එහෙම ඉගෙන ගන්ටත් කාලයත් ලේසියත් නෑ
එයිනි ඔය රටේ බී. ඒ. වලින්වත් සමත් වී
පැමිණිය යුතු බැව් ඕනෑකමින් දන්වන්නෙමි'

*(පරලොවට පණිවිඩයක් - පද්‍ය රචනාව)*

කෝට්ටේ යුගයේ බහුල ලෙස අනුගමනය කළ සිවුපද ආකෘතියෙන් සැදුම් ලත් සමුද්‍රඝෝෂ විරිතෙන් රචනා කරන ලද බුද්ධ ස්තෝත්‍ර නමැති කාව්‍ය ග්‍රන්ථය බුදුන් වහන්සේගේ අපමණ ගුණ සමුදාය ප්‍රකට කරන්නකි.

අපමණ කල් පුරා දස පෙරුමන් සොඳුරු
කරමින නොසිස් එක අත් බවකුදු ඉඳුරු
නුවණින් එකලුකර බිඳහැරි මොහො අඳුරු
සසොබන දිනිඳු ඔබම ය එසමන් බඳුරු

ජන කවියෙන් ලද ආභාසයට නොමඳ ව පළ කෙරෙන ඔහු ගේ කුරක්කන් හේන නමැති කාව්‍ය නිර්මාණය බොහෝ විචාරකයින් ගේ අගැයීමට පාත්‍ර වූ කාව්‍ය රසිකයන් අතර මහත් සේ ජනප්‍රිය වූ කාව්‍ය රචනාවකි.

මුල දී කැලේ හැටි බැලුවම කුමක් වැනී
පිහිය නොදුටු අපෙ මාමගෙ රැවුළ වැනී
හේන කොටා ගිනි තිබ්බම කුමක් වැනී
මඟුල දවසෙ එළි කළ මගෙ මූණ වැනී

පැසී තිබෙන රතු කුරහන් කුමක් වැනී
පොඩි නෑනා දුර සිට අත වනනු වැනී
කරල් කපා මළු පුරවනු කුමක් වැනී
අතිරස උයා මඟුලට එක් කරනු වැනී

**උදේනි සිරිමාන්න**

---

යුද්ධය මොන තරම් වැදගත් ද?
ඇයි නූතන තාක්ෂණය.....
දිරපු අඹ කොට්ට වෙනුවට
ජොනී බට්ටන් ගෙන්
අපි බට්ටන් පනිමු ද.....?

කකුලටත් සනීපයි.....

▫ තනූජා ධර්මපාල, *ලන්ඩනයේ දී.*

---

## මම මාර.....

දුන්නෙමිය සෙවණ අතුපතර විහිදුවා
අව්කාස්ටකේ අනෝරා වැස්සේ
දන්නෙමිය ඔබේ රස රහස් හැම
දෙන්න මට එකම එක හාදුවක්

දස දහස් උණු කඳුළු වැසි වසා
තෙත් කළේ ඔබයි මා පාමුල
දුක් සුසුම් සුවහසක් විසිරිලා
මුදුවෙවී තැවේ මා රුදු බඳ

තනි වී හඬා පැරදිලා පැතු පෙම්
බලා සිටින්නී සිතිජයෙන් එහා ඉම
නොඑන පෙම්වතා එනතුරා මට
දෙන්න එක
එකම එක හාදුවක්.

▫ *අනුර හැගොඩ.*

## තානාපති කාර්යාලය

හරි ලස්සණයි ලන්ඩනයේ පරිසරය
කොමසාරිස් මැඳුර තුළ හරි සුන්දරය
සේවක පිරිස සැමදෙන නිති පින්බරය
සිරිලක් බිමට තව තව ආඩම්බරය

සාමෙන් සමගියෙන් අප සැම එකතු වෙලා
සේවය කරන්නේ බාධක ඉවත හෙලා
කොමසාරිස් මැඳුරේ යන විට සතුට ගලා
ශ්‍රී ලංකාව ලන්ඩනයට සෙතක් වෙලා

පවතින නීතියට නිතරම ගරු කරමූ
ගමන් බලපත්‍ර නිසි විදිහට හදමූ
පණිවුඩ දුරකථන සවනට අරගනිමූ
සේවක මණ්ඩලය සැමට ම සුබ පතමූ

සාමය මල් ගසේ මල් පල පිබි දේවා
මුළු ලෝකයේ යුද ගිනිදැල් නැති වේවා
ලස්සණ එංගලන්තය තව බැබළේවා
අප දෙන දිරිය තුළ ලක්මව සැනසේවා

□ ඇම්.පී. විමලසිරි
මොරටුව - ශ්‍රී ලංකාව

## ලන්ඩනයට ගිය සිඟිති සුරතල්

සුර ලෝකෙන් තෑගි දුන්න
චූටි රෝස සිඟිත්තියක්
මගේ දෝණි ළඟට ඇවිත්
ඇයත් කැටුව මෙන්න ඇවිත්

මුව කිරි මඳ හස පාමින්
සුරතල් පෙන්නා විගසින්
හිතේ සෙනේ පුරා ලමින්
නැලවුණි ගී පද අසමින්

පත්තිනි, දෙව් විමනෙ ඉඳන්
රන් කිරි සිනහා බලමින්
පා සළඹේ සැළෙන හඬින්
නුඹ නළවයි සිනා සෙමින්

නිවසෙ සතුට පිරී ගියා
පාළුව දොම්නස මැකුණා
බිළින්දියක් ගෙනා සිනා
සැම මුව අග රැඳී ගියා

ඒ කිරි කැටි සිඟිත්තියා
මහ සයුරෙන් එතෙර ගියා
අපේ සිතේ සුවඳ තියා
ඇගේ රටට යන්න ගියා

□ කුසුමා එච්. මුදියන්සෙ

## Snake Attack

The snale slithers towards its prey,
On a gentle balmy day,
The black diamond-shaped eyes
Are glued ti the mouse,
Like a sniper that aims at a house,
Winding itself like a spring,
Ready to dart through the air
Like a bird on the wing,

The fange pierce into its lunch,
The little mouse didn't even have a hunch,
It took ine breath and then it was dead,
Lying still on a soft leafy bed.

**By**
Osajie Oboh (10 years old)

## බෑනට ආසිරි

වතේ ඇඳුණ විඩාව සැම සඳ කිරණින් පහ ව යාවි
මඳ පවනින් ඔබේ නෙතේ වෙහෙස සැණින් දුරුව යාවි
තරු එළියෙන් ඔබේ නෙතේ ඉනූ කඳුළු වියළි යාවි
වලා කුළින් එබී බැලූ සුරඟනාවෝ සෙත් පතාවි

සක් දෙවු රජ මිහිමඬලට අසුරු සැණින් පහත් වේවි
සියක් වසක් මොහුට දෙන්න රන් කෙන්දෙන් ලියා යාවි
ඔබ වටකර සුර කුමරියො මුකුළු පපා සිනා සේවි
දෙව් විමනෙන් බැස සුරලියො අමා බඳුන ගෙනත් දේවි

□ සීතා ලිලී ජයසුන්දර
ලන්ඩනයේ දී.

## හැඳින්නෙමි ආදරය

කියවද්දී දෛවයෝගය මවා ගත්තෙමී
නරඹද්දී කැලෑහඳ මනසින් ද වින්දෙමී
සැඟවෙද්දී හිරු හවහට සිහින මැව්වෙමී
සැළවෙද්දී පෙම් පණිවුඩ සිතා බැලුවෙමී

ගුවනින් නැඟෙන ආදර ගී හදට වැදී
මලකින් නැඟෙන මුදු සුවඳක මිහිර වැදී
සැණෙකින් පිබිදුණා ආදර හැඟුම් පොදී
බහකින් රැවටුණෙමි කරුමයෙ පහර වැදී

වන වදුලේ සෙවුවා එහි නැහැ තිබුණේ
ගං ඉවුරේ ඇද්දැයි මට සැකි හිතුණේ
තුරු සෙවණේ ඇති බව නිකමට සිතුණේ
මල් ගොමුවේ පෙතියට සැඟවී තිබුණේ

දෝතින් රැගෙන හදවතටම තුරුලු කරන්
හීනෙන් මැවූ පෙම් ලොව නව කිරුලු දරන්
ගීතෙන් ඇසුණ ආදරයක සුවඳ තියන්
සීතෙන් මිදී නිදියම් රැය පහන් කරන්

□ ලීලානි පෙරේරා - ඉල්ෆඩ්.